**G. G. Arulpragasam**
Attorney-at-Law & Notary Public
&
Commissioner of Oaths
No. 93, Hulftsdorf Street,
Colombo-12.

## කො ළ ඹ  දි සා  අ ධි ක ර ණ යේ දී ය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන
වගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ
කාරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක.167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.

<u>පැමිණිලිකරු</u>

නඩු අංක : 21819/එම්ආර්

- එදිරිව -

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
   " විසුම්පාය ",
   ස්ටේප්ලස් වීදිය,
   කොළඹ - 02 සහ
   අංක.37, හිරුළ පෙදෙස,
   කොළඹ - 05.

2. හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
   කළම්බු හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස් බාරේ,
   එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
   කොළඹ - 01.

<u>විත්තිකරුවෝ</u>

වර්ෂ 1999 ක්වූ ජූලි මස 14 වන දින දීය.

ස්වකීය නීතිඥ ජී.ජී. අරුල්ප්‍රගාසම් මහින් පෙනී සිටින ඉහත නම සඳහන් 2 වන විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශයෙන් මෙසේ ප්‍රකාශ කර සිටී.

01. මෙහි පහත දැක්වෙන කරුණු නිසා, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තියේ ප්‍රකාරව නියෝගයක් ලබා ගැනීම සඳහා ඉහත සඳහන් වන ආකාරයේ ඉල්ලීමක් කිරීමට පැමිණිලිකරුට නීතිය අනුව හිමිකම් නොලැබෙන බව, මූලික විරෝධතාවක් වශයෙන් 2 වන විත්තිකරු ප්‍රකාශ කර සිටී.

    (අ) පැමිණිල්ලෙන් 2 වන විත්තිකරුට විරුද්ධව සහනයක් ඉල්ලා සිටින්නේ නැත.

    (ආ) 2 වන විත්තිකරු වෙත විචාරණ භාරදීම පිණිස පැමිණිලිකරුට නීතියෙන් ඇති හිමිකම් සම්බන්ධයෙන් සහ/හෝ ඒවාට උත්තර දෙන ලෙස 2 වන විත්තිකරුට නියම කිරීමට නීතියෙන් ඇති හිමිකම් සම්බන්ධයෙන් 2 වන විත්තිකරු විසින්

තහන ලද විරෝධතා සම්බන්ධයෙන් විමසුමක් පවත්වා ඇත.

02. ඉහත සඳහන් කරන ලද සම්ප්‍රකාශවලට අගතියක් නොවන පරිදි මෙහි විශේෂයෙන් නිශ්චිත වශයෙන්ම පිළිගන්නා සම්ප්‍රකාශ හැරෙන්නට, 1999 ජුනි 2 වන දින දරණ පෙත්සමේ සහ නිහාල් ශ්‍රී අමරසේකරගේ 1999 ජුනි 2 දින දරණ දිව්රුම් ප්‍රකාශයේ අන්තර්ගත සියලු සහ එක් එක් සම්ප්‍රකාශ 2 වන විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කර සිටී.

03. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තියේ නියමයන් අනුව සහ 1999 මැයි 31 වන දින දරණ විරෝධතා ප්‍රකාශයේ සහ ඩී.වයි. ලියනගේ මහතාගේ 1999 මැයි 31 වන දින දරණ දිව්රුම් ප්‍රකාශයේ දක්වා ඇති හේතූ නිසා එකී විචාරණවලට උත්තරදීම ප්‍රතික්ෂේප කිරීමට 2 වන විත්තිකරුට හිමිකම් තිබෙන බව 2 වන විත්තිකරු කියා සිටී.

04. ඉහත කී කරුණු වලට යටත්ව එකී පෙත්සමේ 1,2,3,4 හා 5 වන ඡේදවල සහ පැමිණිලිකරුගේ එකී දිව්රුම් ප්‍රකාශයේ එම ඡේදවලට අනුරූප ඡේදවල ඇතුළත් සම්ප්‍රකාශ 2 වන විත්තිකරු ප්‍රතික්ෂේප කරයි.

05. මෙහි අන්තර්ගත සම්ප්‍රකාශ වැඩිමනත්ව තහවුරු කිරීම පිණිස වූ 2 වන විත්තිකාර සමාගමේ සභාපති ඩී.වයි. ලියනගේ මහතාගේ දිව්රුම් ප්‍රකාශය මෙයට අමුණා ඇත.

එමනිසා 2 වන විත්තිකරු අයැද සිටින්නේ :-

(අ) 1999 ජුනි මස 2 වන දිනැති පැමිණිලිකරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස සහ/හෝ නිෂ්ප්‍රභා කරන ලෙසත්,

(ආ) 1999 මැයි මස 31 වන දිනැති 2 වන විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශයේ අයැද ඇති සහනයන් ලබාදෙමින් 2 වන විත්තිකරුගේ වාසියට නියෝගයක් කිරීමට ගරු අධිකරණය කරුණාන්විත වන ලෙසත්,

(ඇ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙසත්, සහ

(ඇ) සුදුසු යයි මේ අධිකරණයට පෙනී යන වෙනත් සහ වැඩිදුර සහනයන් ලබා දෙන ලෙසත්,

2 වන විත්තිකරුගේ නීතිඥ

G.G. ARULPRAGASAM
Attorney-at-Law-Commissioner of Oaths
& Notary Public
Office : Nº 93, Hulftsdorp Street,
Colombo 12, Sri Lanka

සකස් කරන ලද්දේ :

නීතිඥ ඒ.එම්. නජීම්,

නීතිඥ තුෂාන් ද අල්විස්,

නීතිඥ ඊ.ඩී. වික්‍රමනායක

විසිනි.

*G. G. Arulpragasam*
Attorney-at-Law & Notary Public
&
Commissioner of Oaths
No. 93, Hulftsdorf Street,
Colombo-12.

# කොළඹ දිසා අධිකරණයේදීය

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේදීය.

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක.167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ - 10.


පැමිණිලිකරු

නඩු අංක : 21819/එම්ආර්

- එදිරිව -

1. ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
" විසුම්පාය ",
ස්ටෙප්ලස් වීදිය,
කොළඹ - 02 සහ
අංක.37, කිරුළ පෙදෙස,
කොළඹ - 05.

2. හොටෙල් ඩිවලොපර්ස් (ලංකා ) ලිමිටඩ්,
කළම්බු හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස් බාරේ,
ඇච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ - 01.




විත්තිකරුවෝ

කොළඹ - 01, ලෝටස් පාර, ඇච්ලන් චතුරශ්‍රය, කළම්බු හිල්ටන් ස්පෝර්ට්ස් කම්ප්ලෙක්ස් බාරේ, හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි දයා යසසිරි ලියනගේ වන මම, බෞද්ධාගම්කාරයකු වශයෙන් මෙහි පහත දැක්වෙන කාරණා ගාම්භීරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත් සහතික කොට ප්‍රකාශ කර සිටිමි.

01. මෙහි ඉහත නම සඳහන් 2 වන විත්තිකාර සමාගමේ සභාපති සහ මෙහි සහතික ප්‍රකාශක මම වෙමි.

02. මෙහි පහත දැක්වෙන කාරණා මගේ පෞද්ගලික දැනීමෙන් ද මට කියවා බැලීමට ලැබුණු ලිපි ලේඛණ ආශ්‍රයෙන් ද මා සතුව ඇති තොරතුරු සහ ලේඛණ ආශ්‍රයෙන් ද මට ප්‍රකාශ කර සිටිමි.

03. මෙහි පහත දැක්වෙන කරුණු නිසා, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තියේ ප්‍රකාරව නියෝගයක් ලබා ගැනීම සඳහා ඉහත සඳහන් වන ආකාරයේ ඉල්ලීමක් කිරීමට පැමිණිලිකරුට හිමිය අනුව හිමිකම් නොලැබෙන බවට මට උපදෙස් ලැබී ඇති නිසා, මූලික විරෝධතාවක් වශයෙන් මම එසේ ප්‍රකාශ කර සිටිමි.

(අ) පැමිණිල්ලෙන් 2 වන විත්තිකරුට විරුද්ධව සහනයක් ඉල්ලා සිටින්නේ නැත.

(ආ) 2 වන විත්තිකරු වෙත විවාරණ භාරදීම පිණිස පැමිණිලිකරුට හිමියෙන් ඇති හිමිකම් සම්බන්ධයෙන් සහ/හෝ ඒවාට උත්තර දෙන ලෙස 2 වන විත්තිකරුට නියම කිරීමට හිමියෙන් ඇති හිමිකම් සම්බන්ධයෙන් 2 වන විත්තිකරු විසින් නඟන ලද විරෝධතා සම්බන්ධයෙන් විමසුමක් පවත්වා නැත.

04. ඉහත සඳහන් කරන ලද සම්ප්‍රකාශවලට අගතියක් නොවන පරිදි මා ප්‍රකාශ කර සිටින්නේ, මෙහි පිටපතු නිශ්චිත වශයෙන්ම පිළිගන්නා සම්ප්‍රකාශ හැරෙන්නට, 1999 ජුනි 2 වන දින දරණ පෙත්සමේ සහ නිහාල් ශ්‍රී අමරසේකරගේ 1999 ජුනි 2 දින දරණ දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගත සියලු සහ එක් එක් සම්ප්‍රකාශ 2 වන විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කර සිටින බවය.

05. මා ප්‍රකාශ කර සිටින්නේ සිවිල් නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තියේ නියමයන් අනුව සහ 1999 මැයි 31 වන දින දරණ විරෝධතා ප්‍රකාශයේ සහ ඩී.එයි. ලියනගේ මහතාගේ 1999 මැයි 31 වන දින දරණ දිවුරුම් ප්‍රකාශයේ දක්වා ඇති හේතු නිසා එකී විවාරණවලට උත්තරදීම ප්‍රතික්ෂේප කිරීමට 2 වන විත්තිකරුට හිමිකම් තිබෙන බවය.

06. ඉහත කී කරුණු වලට යටත්ව, එකී පෙත්සමේ 1,2,3,4 හා 5 වන ඡේදවල සහ පැමිණිලිකරුගේ එකී දිවුරුම් ප්‍රකාශයේ එම ඡේදවලට අනුරූප ඡේදවල අඩංගු සම්ප්‍රකාශ 2 වන විත්තිකරු ප්‍රතික්ෂේප කරන බව මම ප්‍රකාශ කර සිටිමි.

මෙහි ඉහත සඳහන් කරුණු කියවා තේරුම් ගෙන වර්ෂ 1999 ක්වූ ජුලි මස 14 වන දින වන මෙදින කොළඹ දී ප්‍රතිඥා දී අත්සන් තබන ලදී.

මා ඉදිරිපිටදීය.

සාමදාන විනිශ්චයකාර.

WIJE SU... LOKUGE
J... ... Hulftsdorf Street
No. 121, ...
COLOMBO-12.